# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## 10 ශ්‍රේණිය ප්‍රථම වාර පරීක්ෂණය – 2019 මාර්තු

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය – I පත්‍රය

**කාලය : පැය එකයි**

**සටහන:**

*(i) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.*

*(ii) **1 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු හා නිවැරදි පිළිතුර**, දී ඇති පිළිතුරු (1), (2),(3), (4) අතරින් තෝරන්න.*

1. කමල් <u>කඩයට</u> ගොස් <u>අඩුම මුදලට බිස්කට් පැකට්ටුවක්</u> මිලදී ගත්තේය. ඉරි ඇඳි පද හැඳින්වීමට වඩාත් සුදුසු යෙදුම් වන්නේ පිළිවෙලින්
   (1) දත්ත (3) දත්ත හා තොරතුරු
   (2) තොරතුරු (4) තොරතුරු හා දත්ත
2. දත්ත හා තොරතුරු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමන ප්‍රකාශයද?
   (a) කාලානුරූපී බව සහ සම්පූර්ණ බව තොරතුරක ලක්ෂණ දෙකක් වේ.
   (b) තනිව ගත් කළ දත්ත වලට අර්ථයක් නැත.
   (c) දත්ත තොරතුරු මත රඳා පවතී.
   (1) a හා b
   (2) a හා c
   (3) b හා c
   (4) ඉහත සියල්ලම
3. පහත සඳහන් ඒවායින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර ක්ෂේත්‍රයේ භාවිත වන අවස්ථාවක් විස්තර කරනුයේ කුමකින්ද?
   (1) නවීන උපාය මාර්ගික තොරතුරු අන්තර්ජාලයෙන් පිරික්සීම.
   (2) මාර්ගගත සාප්පු සවාරියක් භාවිත කිරීමට, පෙර ගෙවුම් අන්තර්ජාල සේවාවක් මිළදී ගැනීම.
   (3) අධ්‍යාපනික මෘදුකාංගයක් මිළදී ගැනීම සඳහා ණය පත් භාවිතයෙන් මුදල් ගෙවීම.
   (4) ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් හා සම්බන්ධ වී ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම.
4. ඇඟිලි සලකුණු කියවනය පද්ධතියක් ලෙස සැලකිය හැකිය. මක්නිසාද යත් ,
   (a) ඉලෙක්ට්‍රොනික උපාංගයකි.
   (b) එයට ආදාන(Input) ක්‍රියාවලිය(process) ප්‍රතිදාන(output) යන අංගයන් අඩංගුව ඇත.
   (c) එයට අරමුණක් ඇත.
   (d) එය විවිධ සංඝටක වලින් සමන්විතවේ.

   ඉහත ඒවායින් සත්‍ය වන්නේ
   (1) a පමණි. (3) a , b සහ c පමණි.
   (2) b සහ c පමණි. (4) b ,c සහ d පමණි
5. මෙම පරිගණක ඉහළ ආගණන හැකියාවෙන් යුක්තය. ප්‍රමානයෙන් විශාලය. එමෙන්ම මිල අධික හා දුර්ලභ ද වේ. මේවා විද්‍යාත්මක හා ඉංජිනේරු කටයුතුවලදී සංකීර්ණ ගණිත ගැටලු විසඳීමට භාවිත කරනු ලබයි. ඉහත විස්තරයේ සඳහන් පරිගණක වර්ගය වන්නේ
   (1) මහා පරිගණක (3) සුපිරි පරිගණක
   (2) මධ්‍ය පරිගණක (4) ක්ෂුද්‍ර පරිගණක
6. ලොව පළමු ඉලෙක්ට්‍රොනික සංඛ්‍යාංක පරිගණකය (Electronic Digital Computer) “ENIAC”වේ. එහි ප්‍රධාන ඉලෙක්ට්‍රොනික උපාංගය වන්නේ,

(1) රික්තක නල (Vacuum tube)
(2) ට්‍රාන්සිස්ටර (Transistors)
(3) අනුකලිත පරිපථ(Integrated Circuits - IC)
(4) ක්ෂුද්‍ර චිප (Micro chips)

7. පරිගණක පරිණාමයේදී වර්ධනය වූ ලක්ෂණය කුමක්ද?
(1) ප්‍රමාණය
(2) විදුලි පරිභෝජනය
(3) සැකසුම් වේගය
(4) තාප උත්පාදනය

8. ගණිතමය මෙහෙයුම් සිදුකරනු ලබන්නේ පරිගණකයේ කවර කොටසක් (Component) මගින් ද?
(1) ප්‍රතිදාන මතකය
(2) මධ්‍ය සැකසුම් ඒකකය
(3) ආදාන ඒකකය
(4) ද්විතීක ආචයන ඒකකය

9. මධ්‍ය සැකසුම් ඒකකයෙහි අන්තර්ගත ඒකක වන්නේ,
(1) පාලන ඒකකය, අංක ගණිත හා තර්කන ඒකකය,ආදාන ඒකකයයි.
(2) ප්‍රතිදාන ඒකකය, අංක ගණිත හා තර්කන ඒකකය,මතක ඒකක
(3) පාලන ඒකකය, අංක ගණිත හා තර්කන ඒකකය
(4) පාලන ඒකකය, මතක ඒකකය, ප්‍රතිදාන ඒකකයයි.

10. පරිගණක පද්ධතියක මූලික සංරචකයක් **නොවන්නේ** පහත කුමක් ද?
(1) මුද්‍රණ යන්ත්‍ර
(2) මධ්‍යය සැකසුම් ඒකකය
(3) ආදාන උපක්‍රම
(4) ප්‍රතිදාන උපක්‍රම

11. ඵලදායී තොරතුරුවල ගුණාංගයක් **නොවන්නේ** පහත දැක්වෙන කුමක් ද?
(1) අදාළ බව
(2) විශ්වාසනීයත්වය
(3) විශාල ප්‍රමාණයක් පැවතීම
(4) නිරවද්‍යතාව

12. ආදාන උපක්‍රමයක් සහ ප්‍රතිදාන උපක්‍රමයක් යන දෙකම සඳහා භාවිත කළ හැක්කේ,
(1) ස්පර්ශ පෑඩය
(2) ස්පර්ශ තිරය
(3) මතක කාඩ්පත
(4) චුම්භක තීන්ත අනුලක්ෂ කියවනය

13. පහත දැක්වෙන සන්නිවේදන මාධ්‍යය සලකන්න.
(a) අධෝරක්ත (Infrared)
(b) ප්‍රකාශ තන්තු (Fiber optics)
(c) සමාක්ෂ රැහැන් (Coaxial cables)
(d) ක්ෂුද්‍ර තරංග (Micro wave)

ඉහත දැක්වෙන සන්නිවේදන මාධ්‍යය වලින් නියමු **නොවන** මාධ්‍යය (unguided media) සඳහා උදාහරණ වන්නේ,
(1) a පමණි
(2) b පමණි
(3) a හා b පමණි
(4) a හා d පමණි

14. පරිගණක මතක පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පඨන මාත්‍ර මතකය (ROM) ද්විතීක මතකයේ කොටසක් වේ.
(2) සසම්භාවී ප්‍රවේශ මතකය(RAM) සැකසීමට ඇති දත්ත රඳවා තබා ගනී.
(3) මතක රෙජිස්තර භෞතිකව මව් පුවරුව මත ස්ථාන ගත කර ඇත.
(4) සංඛ්‍යාංක බහුවිධ තැටි (DVD) සහ සංයුක්ත තැටි (CD) චුම්භක (magnetic) මාධ්‍යය ලෙස වර්ගීකරණය කර ඇත.

15. පහත ආගණන උපාංග අතුරින් ප්‍රථමයෙන්ම සොයා ගන්නා ලද්දේ කුමක්ද?
(1) ස්ටෙප් රෙකෝනර් (Step Reckoner)
(2) ඇත් දල තීරු (Napier's Bone)

(3) විශ්ලේෂණ යන්ත්‍රය (Analytical Engine)
(4) ආකළන යන්ත්‍රය (Pascaline)

16. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) සහ දෘඪ ඩිස්කය (Hard disk) අතර වෙනස්කම් වන්නේ සසම්භාවී ප්‍රවේශ මතකය............................ වන අතර දෘඪ ඩිස්කය .......................... වීමයි.
(1) තාවකාලික, ස්ථිර
(2) වේගයෙන් අඩු, වේගවත්
(3) අභ්‍යන්තර, බාහිර
(4) ස්ථිර, තාවකාලික

17. ප්‍රවේශවීමේ වේගය අනුව ආචයන උපාංග අවරෝහණ පිළිවෙලට සැකසූ විට
(1) චුම්භක පටි(magnetic tapes), ඩිස්ක(disks) , වාරක මතක (cache), ප්‍රධාන මතක(main memory)
(2) වාරක මතක,ප්‍රධාන මතක, රෙජිස්තර(registers),ඩිස්ක, චුම්භක පටි
(3) රෙජිස්තර, ප්‍රධාන මතකය, වාරක මතක, චුම්භක පටි, ඩිස්ක
(4) රෙජිස්තර, වාරක මතක, ප්‍රධාන මතකය, චුම්භක පටි

18. පහත සඳහන් ඒවායින් කුමන ආචයන උපාංගයක් ලිවීම හා කියවීම සඳහා චුම්භක ක්ෂේත්‍රයක් භාවිතා කරනු ලබයිද?
(1) දෘඩ තැටිය(Hard disk)
(2) සැණෙලි මතක ධාවකය (Flash Drive)
(3) DVD ROM
(4) Blue Ray තැටිය

19. රූප ඇඳීම සහ අනුලක්ෂණ ආදානය කිරීම සඳහා පිළිවෙළින් පහත කුමන උපාංග යුගල භාවිත කළ හැකිද?
(1) යතුරු පුවරුව (Key Board), මූසිකය (Mouse)
(2) Digitizer, මයික්‍රෆෝනය (Microphone)
(3) මූසිකය (Mouse), යතුරු පුවරුව (Keyboard)
(4) මූසිකය (Mouse), ආලෝක පෑන (Light Pen)

20. වෙබ් කැමරාව සලකනු ලබන්නේ
(1) ආදාන උපාංග ලෙසය
(2) ප්‍රතිදාන උපාංග ලෙසය
(3) ආදාන හා ප්‍රතිදාන උපාංග ලෙසය
(4) ආචයන උපාංග ලෙසය

21. පහත සඳහන් ඒවායින් කුමන ඒවා රජයකින් රජයකින් රජයකට සපයනු ලබන සේවාවක් ලෙස සැලකිය හැකිද?(G 2 G)
(1) බැංකු තොරතුරු
(2) ගැසට් පත්‍ර හා චක්‍රලේඛ
(3) රාජ්‍ය තාන්ත්‍රික (Diplomatic) වීසා තොරතුරු
(4) ව්‍යාපාරික හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ තොරතුරු

22. යම් කාර්යාලයක් තුළ ස්ථාපිත කර ඇති පරිගණක ජාලයක් හැඳින්වීම සඳහා වඩාත් සුදුසු යෙදුම තෝරන්න.
(1) ස්ථානීය ප්‍රදේශ ජාල
(2) පුරවර ප්‍රදේශ ජාල
(3) පුළුල් ප්‍රදේශ ජාල
(4) මෙම කිසිවක් නොවේ

23. මෙම ස්ථලය ස්ථල දෙකක ලක්ෂණ දරයි. මෙහි එක් වාසියක් වන්නේ, එක් එක් ජාල කොටස් වෙන වෙනම පාලනය කළ හැකි වීමයි. මෙම විස්තරයෙන් දැක්වෙන ජාල ස්ථලය සඳහා වඩාත් සුදුසු යෙදුම තෝරන්න.
(1) මුදුව (Ring)
(2) තරුව (Star)
(3) බසය (Bus)
(4) රුක් (Tree)

24. පරිගණක ජාල කරණයේ ඇති වාසියක් නොවන්නේ
(1) දත්ත හා තොරතුරු පරිගණක අතර හුවමාරු කිරීමට හැකි වීම
(2) සම්පත් පොදුවේ පරිහරණය කිරීම
(3) අඩු ඉඩක දත්තගබඩා කීමේ හැකියාව
(4) පිටස්තර පුද්ගලයින්ට දත්ත ලබා ගත හැකිවීම

25. පරිගණක ජාලයක ගිණිපවුරක් භාවිතයෙන් අපේක්ෂිත කාර්යයක් නොවන්නේ
(1) අන්තර්ජාලය හා පරිගණක ජාලය අතර දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීම පාළනය කිරීම
(2) අන්තර්ජාල පහසුකම් සැපයීම
(3) අන්තර්ජාලය හා පරිගණක ජාලය අතර ආරක්ෂක බාධකයක් ලෙස ක්‍රියා කිරීම
(4) පරිගණක ජාල අතර තොරතුරු හුවමාරුවේ තදබදය පාළනය කිරීම

26. ස්ථානීය ප්‍රදේශ ජාල (LAN) සඳහා වඩාත් සුදුසු ජාල ස්ථලය(network topology)කුමක්ද?

(1) බසය (Bus)
(2) තරුව (Star)
(3) මුදුව (Ring)
(4) ඉහත සියල්ලම

27. ජාල ස්ථල (network topology) පිළිබඳව සත්‍ය ප්‍රකාශය තෝරන්න

(1) රුක් ස්ථලයේ ප්‍රධාන අවාසිය වන්නේ සම්පූර්ණ ජාලයම එක් ප්‍රධාන පරිගණකයකට සම්බන්ධ වීමයි.
(2) බස් ස්ථලයේ දී එක් පරිගණකයක් ක්‍රියා විරහිත වුවහොත් සම්පූර්ණ ජාලයම බිඳවැටේ.
(3) තාරකා ස්ථලයේදී සියළුම පරිගණක එක් ප්‍රධාන වයරයකට සම්බන්ධවේ.
(4) මුදු ස්ථලය අවම වයර ප්‍රමාණයක් භාවිතා කරයි.

28. ප්‍රකාශ තන්තු(Fiber optic) දත්ත සම්ප්‍රේෂණයට අදාළ ලක්ෂණයක්/ලක්ෂණයන් වන්නේ?

(a) ආලෝකයේ ප්‍රවේගය(Velocity of Light)
(b) විභව අන්තරය(Voltage)
(c) පූර්ණ අභ්‍යන්තර පරාවර්ථනය(Full internal reflection)

(1) a සහ b පමණි.
(2) b සහ c පමණි.
(3) a සහ c පමණි.
(4) c සහ d පමණි.

29. චන්ද්‍රිකා භාවිත කරමින් ස්ථාන දෙකක් අතර දත්ත සන්නිවේදනයේදී යොදා ගන්නා මාධ්‍යය කුමක්ද?

(1) ප්‍රකාශ තන්තු (fiber optic)
(2) ක්‍ෂුද්‍ර තරංග (micro Wave)
(3) ඇඹරි යුගල රැහැන් (twisted pair)
(4) අධෝරක්ත කිරණ (infa-red)

30. දත්ත සන්නිවේදනයේදී නියමු  මාධ්‍යය ලෙස සැලකෙන කවර රැහැන් වර්ගයක් TV ඇන්ටෙනා වයර සඳහා භාවිතා කළ හැකිද?

(1) ආවරක ඇඹරි යුගල රැහැන් (STP)
(2) ප්‍රකාශ තන්තු (Fiber optic)
(3) නිවාරක ඇඹරි යුගල රැහැන් (UTP)
(4) සමාක්ෂක යොත් (Coaxial cables)

31. පරිගණක ජාලයක් ස්ථාපනය කිරීමට අත්‍යාවශ්‍ය වන්නේ පහත ඒවායින් කුමක්ද?

(1) අන්තර්ජාල සැපයුම්කරු(ISP)
(2) මොඩමය (Modem)
(3) ජාල අතුරු මුහුණත් පත (Network interface card)
(4) වෙබ් අතිරික්සුව(Web browser)

32. වේගවත්ම දත්ත සන්නිවේදනයක් සිදුකරනු ලබන රැහැන් වර්ගය වනුයේ(Data communication media)

(1) ආනාවරණ ඇඹරි යුගල රැහැන් (UTP Cable)
(2) සමාක්ෂක යොත් (Coaxial Cable)
(3) Microwave Cable
(4) ප්‍රකාශ තන්තු (Fiber Optics Cable)

33. Portrait සහ Landscape යනු වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සාදන ලද පිටුවක

(1) කොලයේ ප්‍රමාණයයි.
(2) පිටුවේ දිශානතියයි.
(3) පිටුවේ පිරි සැළැස්මයි.
(4) ඉහත සියල්ලයි.

34. වැරදි ප්‍රකාශය තොරන්න.



(1) වදන් සැකසුම් මෘදුකාංගයක තැපැල් මුසුව පහසුකම භාවිතයෙන් එකම සුභ පැතුම් පත කිහිප දෙනෙකුට ගැළපෙන ආකාරයෙන් නිර්මාණය කිරීමට හැකිය.
(2) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සාදන ලද පිටු කිහිපයකින් යුක්ත ලේඛනයක පිටු එකම දිශානතියට පමණක් සකස් කළ හැකිය.
(3) වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් පිටු අංක ඇතුළත් කළ හැකිය.
(4) නව වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සෑදූ ගොනුවක ගොනු දිගුව .docx ලෙස දැක්වේ.

35. පහත සඳහන් ඒවායින් වදන් සැකසුම් ලේඛනයක් හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ/ ප්‍රකාශය වන්නේ,

(a) කැපීමට භාජනය කරන ලද වචනයක් කිහිප වාරයක් ඇලවීම කළ හැකිය.
(b) මකා දමන ලද වචනයක් නැවත ලබා ගත හැකිය
(c) කැපීම සහ ඇලවීම මගින් වචනයක් තිබෙන ස්ථානයක් වෙනස් කළ හැක.

(1) a සහ b නිවැරදියි.
(2) b සහ c නිවැරදියි.
(3) a සහ c නිවැරදියි.
(4) ඉහත සියල්ලම නිවැරදියි.

36. වදන් සැකසුම් ලේඛනයක ස්ථාන ගනනාවකම “Sum” ලෙස සඳහන් විය යුතු වචනය “Some” ලෙස වැරදි ආකාරයෙන් සඳහන් වී ඇත. මෙය නිවැරදි කිරීම සඳහා භාවිත කළ හැකි පහසුකම වන්නේ,
   (1) මැකීම හා නැවත ලිවීම (Delete and Re-type)
   (2) ස්වයං නිවැරදි කිරීම (Auto correct)
   (3) සෙවීම හා ප්‍රතිස්ථාපනය (Find and replace)
   (4) Change Case
37. වදන් සැකසුම් ලේඛනයක පේළි අතර පරතරය වෙනස් කිරීමට යොදාගත හැකි tool එක වන්නේ

   (1) 
   (2) 
   (3) 
   (4) 

38. පහත වාක්‍ය සඳහා භාවිත කර ඇති අක්ෂර ආකෘතිකරණ / හැඩසවීම (Font formats) වන්නේ මොනවාද?

***~~“තොරතුරු සන්නිවේදන තාක්ෂණය”~~***

   (1) Simple Case, Strike Through ,Font face
   (2) Italic , Bold , Strike Through
   (3) Strike Through, Font face, Bold
   (4) Italic, Strike Through, Simple Case
39. MICR වලින් හඳුන්වනුයේ
   (1) Magnetic Ink Character Reader
   (2) Magnetic Ink Character Recognition
   (3) Magnetic Ink Code Reader
   (4) මේ කිසිවක් නොවේ.
40. තෝරාගත් වචනයක් වෙනත් ස්ථානයකට පිටපත් කරගැනීමට යොදා ගත හැකි කෙටි මං යතුර වනුයේ
   (1) Ctrl+V , Ctrl + X
   (2) Ctrl+C , Ctrl + V
   (3) Ctrl+C , Ctrl + X
   (4) Ctrl+X , Ctrl + F

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## 10 ශ්‍රේණිය ප්‍රථම වාර පරීක්ෂණය – 2019 මාර්තු

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

**කාලය: පැය දෙකයි**

සටහන:

*I. පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.*

*II. පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර,අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ*

**1.**

I. **2000MB , 3GB සහ 600MB ධාරිතාවෙන් යුතු මෘදුකාංග 3 ක් අමල් ළඟ ඇත. ඒවා ඔහුගේ මිතුරකුට ලබා දීම සඳහා ඔහුගේ 5620 MB ධාරිතාවයෙන් යුතු සැණෙලි මතකයක් භාවිතයට අපේක්ෂා කරයි.එම කාර්ය සඳහා එම සැණෙලි මතකය ප්‍රමාණවත්ද? ඔබගේ ගණනය කිරීම් පැහැදිලිව දක්වන්න.**

II. පහත ප්‍රකාශ හරි හෝ වැරදි බව ප්‍රකාශ කරන්න

A. පරිගණක තිර සෑදීම සඳහා ආලෝක විමෝචක දියොඩ තාක්ෂණය භාවිතා කරයි.

B. USB කෙවෙනි වලට සම්බන්ධ කළ හැක්කේ සැණෙලි මතක පමණි.

C. සසම්භාවී ප්‍රවේශ මතක මධ්‍ය සැකසුම් ඒකකය තුළ ස්ථාපනය වී ඇත.

D. ශ්‍රී ලංකා සිතියම E- රාජ්‍ය මගින් වෙනත් රාජ්‍යයන් (G2G) සඳහා ලබා දෙන පහසු කමකි.

III. දුරස්ථ අධ්‍යාපනයේ පවත්නා ලක්ෂණ 2ක් ලියන්න.

IV. P සහ Q යන කාර්යාල දෙකේ පිළිවෙළින් ජාල ගත සහ ජාල ගත නොවූ පරිගණක භාවිතා කරයි. Q කාර්යාලයට සාපේක්ෂව P කාර්යාලය ලබන වාසි දෙකක් සඳහන් කරන්න.

V. ජංගම දුරකතනයක් භාවිතයෙන් භාණ්ඩයක් පිළිබඳ වැඩිදුර තොරතුරු නිෂ්පාදන ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමට භාවිතා කල හැකි කේතය කුමක්ද?

VI. ආයතනයක පැමිණීම වාර්තා කිරීම සඳහා යොදා ගතහැකි ආදාන උපාංගය නම් කරන්න.

VII. පහත ලේබල් කර ඇති අයිතම සඳහා නිවැරදි උදාහරණය පහත ලැයිස්තුවෙන් තෝරා ගෙන ලියන්න. ලේබයය හා උදාහරණය ලිවීම ප්‍රමාණවත් වේ.

ලැයිස්තුව - බ්ලූ රේ තැටි , වාරක මතකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය, තීරු කේත කියවනය , මෙහෙයුම් යටිය,ඩිජිටල් කැමරාව

A – දැක්වීමේ උපාංගයකි

B – ප්‍රතිදාන උපාංගයකි

C – සුපරීක්ෂකයකි

D - ද්විතීක ආචයන ඒකකයකි

VIII. පහත A සිට B දක්වා ලේබල කර ඇති වගන්ති සත්‍ය ද /අසත්‍ය ද යන්න සඳහන් කරන්න. ඔබ විසින් කළ යුත්තේ අදාල ලේබලය ලියා එහි සත්‍ය අසත්‍යතාව සඳහන් කිරීම පමණි.

A - පරිගණක පද්ධතියෙහි සියළුම උපක්‍රම පාලනය අංක ගණිතමය හා තාර්කික ඒකකය විසින් සිදු කරයි.

**B -** වාරක මතකය නශ්‍ය නොවන මතකයකි.

**C -** උෂ්ණත්වය පීඩනය , වෝල්ටීයතාවය ආදී සාධක හඳුනා ගැනීමට ප්‍රතිසම පරිගණක වලට හැකියාව පවති.

**D -** මතක කාඩ්පත්( memory card) ඝන තත්වයේ (solid state) උපාංග සඳහා උදාහරණයකි.


IX. වගුවේ A තීරයන් හී ඇති කාර්ය හා ගැළපෙන B තීරයේ ඇති පරීක්ෂණ යන්ත්‍ර තෝරන්න. ගැළපෙන ඉංග්‍රීසි අක්ෂර ලිවීම ප්‍රමාණවත් වේ.

| A | | B | |
|---|---|---|---|
| P | හෘද ස්පන්දනය මැනීම | E | විද්‍යුත් නිකර්පර රේඛණ යන්ත්‍රය (EEG) |
| Q | හෘදයේ ක්‍රියාකාරීත්වය පරිගණක තිරයක දැක්වීම | F | පරිගණකගත ආක්ෂක ශරීර ස්ථර එක්සරේ යන්ත්‍රය (CAT) |
| R | ශරීරයේ අභ්‍යන්තර කොටස් ත්‍රිමානව දැක්වීම | G | හෘද රෝග තිරගැන්වීමේ යන්ත්‍රය |
| S | මොළයේ ක්‍රියාකාරීත්වය දැක්වීම | H | විද්‍යුත් තන්තු රේඛීය යන්ත්‍රය (ECG) |

X. පහත කාර්යයන් සඳහා ගැළපෙන නිවැරදි කෙවෙනිය තෝරන්න. අංකය හා කෙවෙනියේ අක්ෂරය යෙදීම ප්‍රමාණවත් වේ.

| කාර්ය | | කෙවෙනිය | |
|---|---|---|---|
| i. | ස්විචයක් පරිගණකයට සම්බන්ධ කිරීම | A | HDMI |
| ii. | ඩිජිටල් රූපවාහිනි යන්ත්‍රය උකුළු පරිලණකයට සම්බන්ධ කිරීම | B | USB |
| iii. | Microphone එක පරිගණකයට සම්බන්ධ කිරීම | C | RJ45 |
| iv. | අංකිත කැමරාව පරිගණකයට සම්බන්ධ කිරීම | D | ශබ්ද උපාංග කෙවෙනිය |

2. පරිගණක පද්ධතියක සැකසුම දැක්වෙන පහත රූපසටහන අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. A,B,C,D,E,F,G හා H යන හිස්තැන් සඳහා සුදුසු පද අදාළ අක්ෂරය සමග ලියා දක්වන්න.

II. නෂ්‍ය නොවන මතකයක් ලෙස යොදාගත හැකි උපාංගය නිරූපනය කරන අක්ෂරය ලියන්න.

III. G හා B මගින් සිදු කරන කාර්ය කෙටියෙන් ලියන්න.

IV. A, C හා D සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න.

3. පරිගණකයකට සම්බන්ධ කර ඇති විවධ උපාංග පිළිබඳව පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




I. යතුරු පුවරුවක දක්නට ලැබෙන යතුරු වර්ග 4 ක් ලියා උදාහරණ 2ක් බැගින් ලියන්න.

II. ප්‍රධාන වශයෙන් මුද්‍රණ යන්ත්‍ර වර්ග කල හැකි ආකාර දක්වා ඒවාට උදාහරණ 2 බැගින් ලියන්න.

III. දැක්වීම් උපක්‍රම 4 ක් ලියා දක්වන්න.

IV. පරිගණක තිර වර්ග 2ක් ලියා ඒවාට අදාළ වාසියක් හා අවාසියක් බැගින් ලියන්න.

4. පහත දැක්වෙනුයේ වදන් සැකසුම් මෘදුකාංගයක භාවිත වන මෙවලම් කිහිපය රූප සටහනකි.

| A. | B. | C. | D. | E. | F. |
|---|---|---|---|---|---|
|  |  |  |  |  |  |

I. එම මෙවලම් නම් කරන්න.
II. එම මෙවලම් යොදා ගනු ලබන්නේ කුමක් සඳහාද යන්න අදාළ අක්ෂරය සමග ලියා දක්වන්න?
III. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් ලබා දී ඇති පහසුකම් දෙකක් ලියන්න.
IV. වදන් සැකසුම් මෘදුකාංග දෙකක් නම් කරන්න.

5. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතා කර සකසා ඇති පහත රූප සටහන හොඳින් නිරීක්ෂණය කර අදාළ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

# art festival

The school principal has informed that this year's Art festival is going to be celebrated. The assigned task of you team is preparing necessary documents for the art festival. Accordingly you have to design ***letters, invitations*** and ***certificates.***

1. Design invitations
2. Prepare letters to the parents
3. Design certificates




These documents should be well prepared and printed. After drafting the above documents, you now want to find the best method of document preparation. "we should find attractive types of letters and add pictures. A border will give a good finish. A typewriter won't provide such facilities, will it?''

I. රූපයේ දැක්වෙන ආකාරයට ලේඛනය සකස් කිරීමේදී භාවිතා කලයුතු වදන් සැකසුම් පහසුකම් හෝ හැඩසව් ගැන්වීම් මෙවලම් 5ක් ලියන්න.

II. ඉහත දැක්වෙන පළමු ඡේදය පහත දිස්වන ආකාරයට වෙනස් කිරීමට යොදා ගත යුතු මෙවළම කුමක්ද?

The school principal has informed that this year's Art festival is going to be celebrated. The assigned task of you team is preparing necessary documents for the art festival. Accordingly

III. ඉහත ලැයිස්තුව , බුලටින ලැයිස්තුවක් බවට පත් කිරීමට අනුගමනය කලයුතු පියවර ලියන්න.

IV. ඉහත මාතෘකාවේ සියළු අකුරු කැපිටල් අකුරු බවට හැරවීමට අනුගමනය කලයුතු පියවර ලියන්න.


6.

I. දත්ත **සම්ප්‍රේෂණ මාධ්‍ය** වර්ග දෙක ලියා ඒවා නැවත බෙදෙන ආකාරය වගු ගත කර දක්වන්න.

II. පරිගණක ජාලයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

III. පරිගණක ජාල භූමියේ පිහිටීම අනුව වර්ග කළ හැකි ආකාර දක්වා කෙටියෙන් විස්තර කරන්න.

7. පහත රූපසටහනින් අන්තර්ජාලය හා සම්බන්ධ වී තිබෙන පරිගණක ජාලයක් පෙන්නුම් කරයි.




I. A, B, C, D හා E මගින් දක්වා ඇති උපාංග හඳුනාගෙන නම් කරන්න.

II. A මගින් සිදු කරන කාර්ය කෙටියෙන් දක්වන්න.

III. ස්විචය හා නාභිය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

IV. පරිගණක ජාලගත කිරීමේදි භාවිතා කල හැකි ජාල ස්ථල විද්‍යා දෙකක් නම් කර ඇඳ දක්වන්න.